**සේවක අර්ථසාධක අරමුදල - 2022**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

සේවක අර්ථසාධක අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 51 ඡේදය අනුව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායි ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සඳහා වූ ක්ෂය ගණනය කිරීමේ උපලේඛනය අනුව, සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ වත්කම් වටිනාකම මුදල් මණ්ඩලය හා කම්කරු දෙපාර්තමේන්තුවට අදාලව පිළිවෙලින් රු.මිලියන 159.18 ක් හා රු.මිලියන 526.83 ක් විය. එම වත්කම් අතරින් තවදුරටත් භාවිතා කරනු ලබන වත්කම් හඳුනාගෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව සමාලෝචනය නොකිරීමෙන් සිදුවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව නිවැරදි කිරීමටත් තවදුරටත් භාවිතයට ගනු නොලබන වත්කම් සුදුසු පරිදි අපහරණය කිරීමටත් කටයුතු කර නොතිබුණි. | කම්කරු දෙපාර්තමේන්තුවට අදාලව ක්ෂය අවසන් කර ඇති ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන අතර භාවිතයට ගත නොහැකි ස්ථාවර වත්කම් ඉවත් කිරීම සඳහා අදාළ භාණ්ඩ සමීක්ෂණය කමිටුව විසින් සිදු කරමින් පවතී. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව කටයුතු කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද බැංකු ගිණුම් 07 කට අදාල බැංකු සැසඳුම් ප්‍රකාශන අනුව පහත සඳහන් පරිදි 2001 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදයට අයත් නිරවුල් නොකරන ලද එකතුව රු.මිලියන 11,515.19 ක ශේෂයක් හා 2022 වර්ෂයට අදාළව රු.මිලියන 672.64 ශේෂයක් නිවැරදි කිරීමට හෝ නිරාකරණය කිරීමට අදාල පියවර නොගෙන 2023 මාර්තු 31 දින වනවිටත් දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි දක්වා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (i) | 2021 වර්ෂයට පෙර නිකුත් කළ නමුත් අගරු වූ චෙක්පත්, බැංකු ප්‍රකාශයේ සහ මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු, ඍජු හර හා බැර ශේෂ වල මුළු වටිනාකම වූ රු.මිලියන 10,918.89 ක් මේ දක්වා නිරවුල් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයට අදාලව මුදල් පොතේ සටහන් නොවූ ගනුදෙනු සහ ඍජු හර හා බැර ශේෂ වල එකතුව රු.මිලියන 597.54 ක් විය. | 2022 වර්ෂයට අදාල හඳුනා නොගත් ගනුදෙනු සියල්ලක්ම පාහේ නිවැරදි ලෙස මුදල් පොතේ වාර්තා කර ඇත. සමහර ගනුදෙනුවල ස්වභාවය අනුව නිරාකරණය කිරීම සඳහා තොරතුරු ලැබෙනුයේ ඉදිරි කාලපරිච්ඡේදවල වන බැවින් එම ගනුදෙනු නිරවුල් කිරීම සිදු කල හැකි වනුයේ ස්වාභාවිකවම යම් කාල ප්‍රමාදයක් සහිතවය. සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් පාර්ශවයන්ගේ සහාය ද ඇතිව බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි පවතින නිරාකරණය නොවූ ගනුදෙනු නිරවුල් කිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | පෙන්වා දී ඇති අඩුපාඩු කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) | තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ මුදල් ඇණවුම්, උපලබ්ධි නොවූ චෙක්පත් හා නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් වල මුළු වටිනාකම රු.මිලියන 523.39 ක් විය. ඒ තුළ වර්ෂයක වැඩි කාලයක සිට පවතින ශේෂ එකතුව රු.මිලියන 454.98 කි. | 2022 වර්ෂයට අදාල හඳුනා නොගත් ගනුදෙනු සියල්ලක්ම පාහේ නිවැරදි ලෙස මුදල් පොතේ වාර්තා කර ඇත. සමහර ගනුදෙනුවල ස්වභාවය අනුව නිරාකරණය කිරීම සඳහා තොරතුරු ලැබෙනුයේ ඉදිරි කාලපරිච්ඡේදවල වන බැවින් එම ගනුදෙනු නිරවුල් කිරීම සිදු කල හැකි වනුයේ ස්වාභාවිකවම යම් කාල ප්‍රමාදයක් සහිතවය. සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් පාර්ශවයන්ගේ සහාය ද ඇතිව බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි පවතින නිරාකරණය නොවූ ගනුදෙනු නිරවුල් කිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | පෙන්වා දී ඇති අඩුපාඩු කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (iii) | භාවිතා කරන පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂයක් ලෙස 2006 වර්ෂයේ සිට ඉදිරියට ගෙන එමින් පැවති හර ශේෂය රු.මිලියන 141.32 ක් වූ අතර සමාලෝචිත වර්ෂයට අදාළව මුදල් පොතේ සිදු වූ වැරදි ශේෂය රු.මිලියන 6.67 ක්ද පැවතුණි. | 2022 වර්ෂයට අදාල හඳුනා නොගත් ගනුදෙනු සියල්ලක්ම පාහේ නිවැරදි ලෙස මුදල් පොතේ වාර්තා කර ඇත. සමහර ගනුදෙනුවල ස්වභාවය අනුව නිරාකරණය කිරීම සඳහා තොරතුරු ලැබෙනුයේ ඉදිරි කාලපරිච්ඡේදවල වන බැවින් | පරිගණක ගිණුම්කරණ පද්ධතියේ දෝෂය කඩිනමින් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | එම ගනුදෙනු නිරවුල් කිරීම සිදු කල හැකි වනුයේ ස්වාභාවිකවම යම් කාල ප්‍රමාදයක් සහිතවය. සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් පාර්ශවයන්ගේ සහාය ද ඇතිව බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි පවතින නිරාකරණය නොවූ ගනුදෙනු නිරවුල් කිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | |
| (ආ) අරමුදලෙහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ප්‍රකාරව මෝටර් රථ වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය යටතේ සියයට 20 බැගින් ක්ෂය කල යුතු වේ. 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව (කම්කරු දෙපාර්තමේන්තුවට අදාලව) මෝටර් රථ පිරිවැය රු.මිලියන 97.20 ක් වූ අතර, ක්ෂය ගණනය කිරීමේ ලේඛන අනුව සම්පූර්ණයෙන් ක්ෂය කල මෝටර් රථවල පිරිවැය රු.මිලියන 36.22 ක් විය. ඒ අනුව පිරිවැය රු.මිලියන 60.98 ක් වූ මෝටර් රථ සඳහා ක්ෂයවීම් ගණනය කල යුතු වුවද, 2020, 2021 හා 2022 වර්ෂය සඳහා ක්ෂය වීම් ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් වල ක්ෂය ගණනය කිරීම, වත්කම් අපහරණය, ස්ථාවර වත්කම් වල ඵලදායී ජීව කාලය ගණනය කිරීම, තවදුරටත් භාවිත කල හැකි වත්කම් හඳුනා ගැනීම පිළිබඳ පෙර වර්ෂ වල සිට පැවත එන ගැටළු පවතින අතර එම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කරමි. | ගිණුම් ප්‍රතිපත්තිය අනුව ස්ථාවර වත්කම් ක්ෂය ගිණුම්ගත කළ යුතු විම. |
| (ඇ) සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් කම්කරු කාර්යාල වැඩි දියුණු කිරීම් සඳහා දරන ලද රු.මිලියන 97.18 ක් මෙහෙවර පියස අභ්‍යන්තර නිර්මිත සැකසීමේ නොනිම් වැඩ ගිණුම තුල දක්වා තිබුණි. | සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් වෙන් වූ ප්‍රතිපාදන කොටසක් ප්‍රාදේශීය කාර්යාලයන්හි සේ.අ.අ. කවුළු ඇති කිරීම හා මහජනතාවට සේවා සැපයීමේ අවශ්‍යතාවය වෙනුවෙන් කරන ඉදිකිරීම් සඳහා වැය කර ඇත. | ප්‍රාග්ධන වියදම් මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව ඉදිරිපත් කිරීම සිදු කල යුතු විම. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම (රු.මිලියන) | අනුරූපී වාර්තා අනුව වටිනාකම (රු.මිලියන) | වෙනස (රු.මිලියන) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| දේපළ, පිරියත හා උපකරණ | 1,130.30 | 713.38 | 416.92 | ඉදිරියේදී සිදු කිරීමට අපේක්ෂිත ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය මගින් නිවැරදි අගයන් හඳුනා ගැනීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් දත්ත හා අනුරූපී වාර්තාවල ඇතුළත් දත්ත සැසඳීම් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1999 පෙබරවාරි 11 දිනැති අංක 01/99 දරන කම්කරු දෙපාර්තමේන්තු චක්‍රලේඛ | ඇල්පිටිය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ 2022 වර්ෂයට අදාලව ආයතන පරීක්ෂණ කටයුතු සිදුකර අධිභාර හා දායක මුදල් අයකර ගැනීමේ ප්‍රථම නිවේදනය නිකුත් කර අවසාන නිවේදනය යැවීමට දින 20 සිට දින 321 ක් දක්වා වූ කාලයක් ගතවී තිබූ අවස්ථා 88 ක්ද, මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාලව දින 26 සිට දින 225 දක්වා කාලයක් ගත වී තිබූ අවස්ථා 45 ක්ද, නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, ප්‍රථම නිවේදන නිකුත් කර තිබුණද අවසන් නිවේදන නිකුත් කර නොතිබූ අවස්ථා 74 ක් ඇල්පිටිය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාලවද අවස්ථා 62 ක් මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයට අදාලවද පැවතුණි.<br><br>ඇල්පිටිය හා මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාල වලට අදාලව හිඟ දායක මුදල් හා අධිභාර මුදල් අයකර ගැනීමට නිවේදන යවා තිබූ අතර පිළිවෙලින් අවස්ථා 92 කදී හා 89 කදී රු.මිලියන 33 ක් හා රු.මිලියන 142 ක් අයවීමට තිබුණි. | පසුගිය වකවානුව තුල පැවති ප්‍රවාහන , ඉන්ධන අර්බුදය නිසා සේවා මුර ක්‍රමයට සේවයට වාර්තා කිරීම, රජය විසින් විදුලිය විසන්ධි කිරීම් සිදු කිරීම හා සාමාන්‍ය රාජකාරී කාලය තුල ඇතිවන අනෙකුත් දුෂ්කරතා ආදී හේතු මත නිවේදන නිකුත් කිරීමේ ප්‍රමාදයක් සිදුවිය. | ප්‍රමාදයකින් තොරව නිවේදන යැවීම තුලින් සාමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2019 දෙසැම්බර් 17 දිනැති PED චක්‍රලේඛ අංක 8/2019 හි 2.1 ඡේදය | විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන පද්ධතිය සමඟ ලියාපදිංචි වී නොතිබුණි. | ලියාපදිංචිය සඳහා අදාල අයදුම්පත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය වෙත යවා ඇත. | චක්‍රලේඛ නියමයන් ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මු.රෙ 877 (2) (ඇ) | අරමුදල පිළිබඳ සහතික කළ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව චක්‍රලේඛ ප්‍රකාරව ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නොමැත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 314,052 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.මිලියන 340,728 ක් විය. ඒ අනුව මෙහෙයුම් ප්‍රතිඵලයෙහි රු.මිලියන 26,676 ක පසුබෑමක් නිරීක්ෂණය විය. අරමුදලෙහි පොළී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.මිලියන 55,591 කින් වර්ධනය වුවද මූල්‍ය උපකරණවල සාධාරණ අගය ගැලපීම මත හඳුනාගත් අලාභය රු.මිලියන 40,878 ක් වීම මෙම පසුබෑමට හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| | | විස්තරය | 2022 වර්ෂය (රු.මිලියන) | 2021 වර්ෂය (රු. මිලියන) | ආදායම වැඩිවීම/ (අඩුවීම) (රු. මිලියන) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| (අ) | | **පොළී ආදායම** | | | | |
| | (i) | භාණ්ඩාගාර බැඳුම්කර | 325,423 | 285,052 | 40,371 | 14 |
| | (ii) | භාණ්ඩාගාර බිල්පත් | 15,272 | 256 | 15,016 | 5866 |
| | (iii) | ස්ථාවර තැන්පතු | 4,225 | 3,857 | 368 | 10 |
| | (iv) | ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් | 1,421 | 544 | 877 | 161 |
| | (v) | ණයකර - ලැයිස්තුගත | 2,291 | 3,153 | (862) | -27 |
| | (vi) | ණයකර - ලැයිස්තුගත නොවූ | 637 | 816 | (179) | -22 |
| (ආ) | | **ලාභාංශ ආදායම - සාමාන්‍යය කොටස්** | | | | |
| | (i) | ලැයිස්තුගත | 3,570 | 4,057 | (487) | -12 |
| | (ii) | ලැයිස්තුගත නොවූ | 3,957 | 2,628 | 1,329 | 51 |

ඉකුත් වර්ෂය හා සැසඳීමේ දී 2022 වර්ෂයේදී භාණ්ඩාගාර බැඳුම්කර, ස්ථාවර තැන්පතු හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්වල ආයෝජනයෙන් ලද පොළී ආදායම පිළිවෙලින් සියයට 14 කින් සියයට 10 කින් හා සියයට 161 කින් වර්ධනය වී තිබුණි. තවද, භාණ්ඩාගාර බිල්පත්හි ආයෝජනයෙන් ලද පොළී ආදායම සියයට 5866 වර්ධනය වී තිබුණි. එසේ වුවද, ණයකර ලැයිස්තුගත හා ලැයිස්තුගත නොවූ ආයෝජනයෙන් ලද පොළී ආදායම පිළිවෙලින් සියයට 27 කින් හා 22 කින් අඩු වී තිබුණි. කෙසේ වුවත්, අරමුදලෙහි සමස්ථ පොළී ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 18.8 කින් වර්ධනය වී තිබුණි.

තවද, අරමුදලෙහි ලාභාංශ ආදායම සැලකීමේදී, ඉකුත් වර්ෂයට සාපේක්ෂව ලැයිස්තුගත සමාගම් වලින් ලද ලාභාංශ ආදායම සියයට 12 කින් අඩු වී තිබූ අතර ලැයිස්තුගත නොවූ සමාගම් වලින් ලද ලාභාංශ ආදායම සියයට 51 කින් වර්ධනය වී තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා අරමුදලේ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| | අනුපාත | 2022 | 2021 |
|---|---|---|---|
| (i) | ශුද්ධ ලාභ අනුපාතය (%) | 83.52 | 87.35 |
| (ii) | සාමාන්‍ය ආයෝජනය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 9.12 | 10.78 |
| (iii) | සාමාජික ශේෂය මත ප්‍රතිලාභ අනුපාතය (%) | 8.21 | 8.21 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැයිස්තුගත සමාගම් 11 ක සිදුකර තිබූ රු.මිලියන 9,087.68 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. | 2019 වසරේදී සිදුවූ පාස්කු ඉරුදින ප්‍රහාරය, 2020-2021 වසරවලදී කොවිඩ් - 19 වසංගත තත්ත්වය සහ 2022 වර්ෂයේදී පැවති සාර්ව ආර්ථික දුෂ්කරතාවයන් හා පැවති දේශපාලනික අස්ථාවරත්වය ආදිය හේතුවෙන් අදාළ සමාගම්වල මෙහෙයුම් කටයුතු සැලකිය යුතු තරම් අඩාල විය. | ආයෝජනයන් සිදු කිරීමේදී සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ලැයිස්තුගත සමාගම් 08 ක සිදුකර තිබූ රු.මිලියන 7,329.84 ක් වූ සාමාන්‍ය කොටස් ආයෝජනයන් සඳහා 2021 හා 2022 වර්ෂ වලට අදාල ලාභාංශ ආදායම් ලැබී නොතිබුණි. | සමාගම් 06 ක් 2021 හා 2022 වර්ෂයන්හිදී අලාභ වාර්තා කර තිබීම සහ 2021 වර්ෂය තුළදී තවදුරටත් ව්‍යාප්ත වූ වසංගත තත්ත්වය හා බැඳුණු සීමා කිරීම් සහ 2022 වර්ෂයේදී පැවති සාර්ව ආර්ථික හා දේශපාලනික අස්ථාවරත්වයන් හේතුවෙන් සමාගම්හි ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඩාල වීම තුළින් ද, ලාභාංශ ප්‍රකාශ නොකර සිටීමට හේතුවිය හැකිය. | ආයෝජනයන් සිදු කිරීමේදී සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2010 වර්ෂයේ දී ගුවන් සමාගමක් වෙත කරන ලද රු.මිලියන 500 ක ආයෝජන සඳහා මේ දක්වාම කිසිදු ආදායමක් අරමුදලට ලැබී නොතිබුණි. | මෙය මුළුමනින්ම පාහේ රජයේ හිමිකාරීත්වය යටතේ පවතින සමාගමක් වන අතර, දිගින් දිගටම පාඩු ලැබීම හේතුවෙන් රජය විසින් භාණ්ඩාගාරය හරහා ලබාදෙන ලද මූල්‍ය ප්‍රතිපාදන මත පවත්වාගෙන යන සමාගමකි. | ආයෝජනයන් සිදු කිරීමේදී සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2021 දෙසැම්බර් 31 දින "ද ෆිනෑන්ස් සමාගමෙහි" බලපත්‍රය අවලංගු කිරීම හේතුවෙන් අරමුදලට රු.මිලියන 205.49 ක් අහිමි වී තිබුණි. | 2020 මැයි 22 දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම සමාගමට නිකුත් කර තිබූ කල්බදු ව්‍යාපාර බලපත්‍රය අවලංගු කිරීමෙන් අනතුරුව, 2020 දෙසැම්බර් 28 වන දින කොළඹ කොටස් වෙළඳපොළ මගින් මෙම සමාගමේ කොටස් ගනුදෙනු අත්හිටුවා ඇත. එම නිසා, සමාගම ඈවර කිරීමකදී, අරමුදලට එහි ආයෝජනය හෝ කොටසක්, ඉතිරි වටිනාකම ලෙස ලැබිය හැකිය. | ආයෝජනයන් සිදු කිරීමේදී සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි ප්‍රශස්ථ ආයෝජනයන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ලැයිස්තුගත නොවූ සමාගම්වල කොටස් ආයෝජනයෙන් රු.මිලියන 5,000 ක් එනම් සියයට 53 ක් 2013 වර්ෂයේ දී හෝටල් සංකීර්ණයක් ඉදිකිරීම සඳහා ආයෝජනය කර තිබූ අතර එම හෝටල් සංකීර්ණය ඉදිකිරීමට අදාල ග්‍රෑන්ඩ් හයට් කොළඹ | අදාළ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් ඉදිකිරීම් නැවත ආරම්භ කිරීමට තීරණය කොට තිබුනද, ඊට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමේ හා විදේශ විනිමය ලබා ගැනීමේ ගැටළු පැවතුනු බව ප්‍රකාශිත අතර, ඒ හේතුවෙන් විදේශ ආයෝජන ලබාගැනීම සඳහා 2021 | ආයෝජනයන් සිදු කිරීමේදී සාමාජිකයන්ට ඉහල ප්‍රතිලාභ ලබා දීමට හැකි වන පරිදි අවදානම අවම වන ප්‍රශස්ථ ආයෝජනයන් සිදු කිරීම. |

| | | | |
|---|---|---|---|
| | ව්‍යාපෘතියේ ඉදිකිරීමේ කටයුතු 2020 ජූලි මාසයේදී නැවත ආරම්භ කලද ඊට අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලින් සිදු කිරීමටත් මූල්‍ය අවශ්‍යතා රැස් කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය බලතල ලබා දීම සිදු කර තිබුණේ 2022 ජනවාරි 04 දිනැති අංක 21/2278/306/100 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගිනි. ඒ අනුව සැලසුම් කල අයුරින් 2021 දෙසැම්බර් 27 වන විට හෝටල් සංකීර්ණයේ ඉදිකිරීමේ කටයුතු අවසන් කල යුතු වුවද විගණිත දින වන විටත් මෙම ඉදිකිරීම් කටයුතු අවසන් වී නොතිබුණි. ඒ අනුව යථෝක්ත ආයෝජනය සිදු කර වර්ෂ 9 ක් ගත වුවද ආයෝජනයෙන් කිසිදු ප්‍රතිලාභයක් මේ දක්වාම අරමුදලට ලැබී නොතිබුණි. | වසරේ ඔක්තෝබර් මාසයේදී හෝටල් සමාගම විසින් අයෝජන යෝජනා කැඳවා තිබුනි. රටේ පැවතුන විදේශ විනිමය අර්බුදය හා ආර්ථික තත්වයන් යටතේ එය ක්‍රියාත්මක කිරීමට නොහැකි බව සමාගම විසින් දන්වා තිබුණි. | |
| (ඊ) | 2016 වර්ෂයට පෙර ලද පෙර ගෙවීම්හි ඇතුලත් රු.මිලියන 4.8 ක හඳුනානොගත් අත්තිකාරම් සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ලේඛණ ඉදිරිපත් නොවූ අතර එම අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | දැනට ඉතිරිව පවතින මෙම ශේෂය නිරවුල් කිරීම සඳහා ප්‍රමාණවත් තොරතුරු දෙපාර්තමේන්තුව සතුව නොමැත.ඒ පිළිබඳව මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවට (AAC) සහ මුදල් මණ්ඩලයට ඒ පිළිබඳව දැනුවත් කර, ඒවායේ නිරීක්ෂණ ද සැලකිල්ලට ගෙන 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අදාළ ගැළපුම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ හඳුනා ගැනීමට හා පියවීමට අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | මහරගම දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ ලියාපදිංචි ආයතන 1,428 ක් ලියාපදිංචි දින සිටම දායක මුදල් ගෙවා නොතිබුණ ද එම ආයතන වසා දැමූ හෝ මෙහෙයුම් කටයුතු නවතා දැමූ ආයතන ද යන්න හඳුනාගෙන නොතිබුණි. 2021 හා 2022 වර්ෂයන්හි අලුතින් ලියාපදිංචි කර තිබූ ආයතන 81 ක් ලියාපදිංචි වූ දින සිටම දායක මුදල් ගෙවා නොතිබුණි. | ආයතන 46 කින් හිඟ දායක මුදල් අයකර ගැනීමට මේ වන විට පියවර ගෙන ඇති අතර 2021 හා 2022 වර්ෂයන්හිදී අලුතින් ලියාපදිංචි කල ආයතන 81 කින් ආයතන 21 ට අදාල දායක මුදල් අයකර ගැනිමට පියවර ගෙන නැත. | හිඟ දායක හා අධිභාර මුදල් අයකර ගැනීමේ විධිමත් වැඩපිළිවෙලක් සකස් කර සාමාජිකයින්ට ප්‍රශස්ථ සේවයක් ලබාදීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | අරමුදලේ සාමාජිකයන්ට නව හැඳුනුම්පත් නිකුත් කිරීම සහ නැවත ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා ආරම්භ කළ ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 12.61 ක් වැයකර කාඩ්පත් 15,000 ක් ද, රු.මිලියන 17.67 ක් වැයකර ගිණුම් ශේෂ පිරික්සීමේ යන්ත්‍ර | සාමාජිකයන්ගේ ශේෂය පරීක්ෂා කිරීම සඳහා KIOSK ID Cards 15,000 ක් මුද්‍රණය කළද එක් කාඩ් පතක් සඳහා රු. 600 ක මුදලක් වැය වීම හේතුවෙන් E-wis ආයතනය සමග සාකච්ඡා කර අමතර ගාස්තුවක් නොරව ඇඟිලි සලකුණු භාවිතා කරමින් KIOSK යන්ත්‍ර | මනා සැලැස්මක් හා අධ්‍යයනයක් සහිතව ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම හා සාමාජික අරමුදලින් වියදම් දැරීමේදී ඵලදායී ලෙස වියදම් දැරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (KIOSK) 35 ක් ද මිල දී ගෙන තිබුණි. මිලදී ගත් මෙම කාඩ්පත් 15,000 අදාළ කාර්ය සඳහා උපයෝගී කර නොගෙන විගණිත දින වනවිටත් නිශ්කාර්යව තොරතුරු තාක්ෂණ අංශයේ රඳවාගෙන තිබුණු අතර යන්ත්‍ර 35 කින් යන්ත්‍ර 2 ක් අපහරණය කර තිබුණි. අක්‍රීය තත්ත්වයේ පවතින ඉතිරි යන්ත්‍ර 33 න් 25 ක් අපහරණය සඳහා ප්‍රධාන කාර්යාලයට රැගෙන විත් තිබුණි. වර්තමානයේ ක්‍රියාත්මක නොවන මෙම ව්‍යාපෘතිය සඳහා නිසි අවශ්‍යතා හඳුනා ගෙන වත්කම් මිලදී ගැනීමටත්, කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කර නොතිබීම හේතුවෙන් අරමුදලේ මුදල් නිශ්කාර්යව වැයකර ඇති බව නිරීක්ෂණය විය. | හරහා ශේෂය පරීක්ෂා කිරීමට හැකි වන පරිදි පරිගණක වැඩසටහන් සංශෝධනය කරන ලදී .KIOSK යන්ත්‍ර 35 දීප ව්‍යාප්තව සවි කර වසර 05 ට අධික කාලයක් ගත වීමෙන් පසුව ඒවායේ ඵලදායි ජීවිත කාලය සමාලෝචනය කර ක්ෂය ගැලපුම් කරන ලද අතර මේ වන විට යන්ත්‍ර 14 ක් ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා තවදුරටත් ප්‍රයෝජනයට ගත හැකි Finger Print Scanner යන්ත්‍ර 08 ක් ඒවායේ අවශ්‍යතාවය පරිදි දිස්ත්‍රික් කම්කරු කාර්යාල 08 ක් වෙත බෙදා හැරීමට කටයුතු කර ඇත. | |
| (එ) | ඡායාරූප හා ඇඟිලි සලකුණු ව්‍යාපෘතිය සඳහා 2017 වර්ෂයේ මිලදී ගත් Logitech Quick Camera 12 ක් සහ 2019 වර්ෂයේ රු.මිලියන 1.7 ක් වැය කර මිලට ගත් Logitech Quick Camera 50 න් 35 ක් ද, 2018 වර්ෂයේ රු.මිලියන 3.3 ක් වැය කර මිලදී ගත් ලැප්ටොප් පරිගණක 24 න් 2 ක් තවදුරටත් නිශ්කාර්යව පවතින බව තොග පොත් පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | පරිගණක 24 හා Logitech Quick Camera භාවිතා කරනු ලබන අංශ වල අඛණ්ඩ සේවා සැපයුමක් සඳහා රඳවා තබා ගන්නා ලද එම උපාංග අවශ්‍යතාවය අනුව කාර්යාල වෙත වෙන් වෙන්ව බෙදා හැරීමට කටයුතු කරන ලද බවත් දන්වා සිටිමි. | මනා සැලැස්මක් හා අධ්‍යයනයක් සහිතව ව්‍යාපෘති ආරම්භ කළ යුතු වීම හා සාමාජික අරමුදලින් වියදම් දැරීමේදී ඵලදායී ලෙස වියදම් දැරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලේ සාමාජික ගිණුම් ශේෂය වූ රු.මිලියන 3,380,616.83 න් රු.මිලියන 63,571 ක් විවිධ හේතු මත එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමෙන් තොරව පැවතුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |

| | | | |
|---|---|---|---|
| (i) | සාමාජික අරමුදල තුල ඇති කම්කරු කොමසාරිස් ගිණුමේ සේවායෝජකයින්ට එරෙහිව නඩු පැවරීමෙන් අයකරගෙන තිබූ මුදලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ රඳවාගෙන ඇති රු.මිලියන 11,123 ක් වූ මුදල සහ එසේ නඩු පැවරීමෙන් අයකරගෙන නිරවුල් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පතු ගිණුමක රඳවාගෙන තිබූ රු.මිලියන 334 ක් වූ මුදල එක් එක් සාමාජික ගිණුම්වලට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | “සී” වාර්තා රහිතව යොමු කළ දායක මුදල් මෙන්ම අසම්පූර්ණ හෝ විෂමතා සහිත “සී” වාර්තා සමඟ යොමු කළ දායක මුදල් පැවතීම. 1994 වර්ෂයේ සිට සේවාායතන අංක රහිතව යොමු කල දායක මුදල් “Z” නමින් තාවකාලික සේවායෝජක අංක යටතේ කම්කරු කොමසාරිස් ගිණුමෙහි රඳවා පැවතීම ආදී හේතු මත මෙම ගිණුමෙහි පවතින ශේෂයන් කේවල සාමාජික ගිණුම් වෙත ගිණුම්ගත කිරීමට නොහැකිව පවතී. | නිරවුල් කර නොමැති දායක මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමේ කාර්යක්ෂම වැඩපිළිවෙලක් සකස් කල යුතුය. |
| (ii) | සේවායෝජකයින්ගේ නමින් වෙන් වෙන්ව පවත්වාගෙනයනු ලබන "ජංගම වර්ෂයේ දායක මුදල් අංක 01” නමින් වූ ගිණුමේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.මිලියන 49,365 ක ශේෂය අදාළ සාමාජිකයන් වෙත විභජනය කර නොතිබුණි. සාමාජික ගිණුම්වලට බැර නොකර පවතින ගිණුම් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන ලෙස 2013, 2016 හා 2017 වර්ෂවලදී රාජ්‍ය ගිණුම්කාරක සභා නියෝග මඟින් නියම කර තිබුණි. තවද මෙම ශේෂය තුල කුමන වර්ෂ වලට අයත් ශේෂ පවතීද යන්න තහවුරු කර ගැනීම සඳහා කාල විශ්ලේෂණයක් විගණනය වෙත ඉදිරිපත් නොවුණි. | සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව විසින් සේවායෝජක දායක මුදල් ගිණුමෙහි පවතින ශේෂය නිරාකරණය කිරීම සඳහා, අදාළ ගිණුමෙහි දායක මුදල් එක් රැස් නොවීම සඳහා දායක මුදල් ගෙවීම සඳහා ගෙවුම් ක්‍රමවේද සැකසීම සහ දායක මුදල්, අදාළ කේවල සාමාජික ගිණුම්වලට යාවත්කාලීන කිරීම කඩිනම් කිරීම සඳහා ගත හැකි උපරිම ක්‍රියාමාර්ග ගෙන ඇති බව ප්‍රකාශ කරමු. | නිරවුල් කර නොමැති දායක මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමේ කාර්යක්ෂම වැඩපිළිවෙලක් සකස් කල යුතුය. |
| (iii) | නිරවුල් කිරීමට ප්‍රමාණවත් පියවර ගෙන තිබුණ ද විවිධ හේතු මත සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.මිලියන 980 ක් ද, ඌන/අතිරික්ත දායක මුදල් වශයෙන් රු.මිලියන 2,232 ක් ද, ඌන/අතිරික්ත ප්‍රතිලාභ ගෙවීම් වශයෙන් රු.මිලියන 463 ක් ද සාමාජික අරමුදල යටතේ තවදුරටත් නිරවුල් කිරීමට පැවතුණි. | උක්ත ගිණුම්හි මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම හා සහයෝගය අවශ්‍ය බවත් එසේම සේ. අ. අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව කවර පියවර ගනු ලැබුව ද සාමාජිකයින් විසින් ඔවුන්ගේ බැංකු ගිණුම් පිළිබඳ නිවැරදි තොරතුරු කම්කරු දෙපාර්තමේන්තුව හරහා අප වෙත දන්වන තෙක් උක්ත ගිණුම්හි ශේෂයන් නිරවුල් කිරීම ප්‍රායෝගිකව සිදුකළ නොහැකි බව තවදුරටත් දන්වා සිටිමු. | නිරවුල් කර නොමැති දායක මුදල් අප්‍රමාදව නිරවුල් කිරීමේ කාර්යක්ෂම වැඩපිළිවෙලක් සකස් කල යුතුය. |
| (ආ) | මියගිය සාමාජිකයින්ට හිමි සේවක අර්ථසාධක ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත් පරීක්ෂාවේ දී සමාලෝචිත වර්ෂයේ ජූනි 20 දිනට ප්‍රධාන කාර්යාලයේ පැවති නොගෙවූ මරණ ප්‍රතිලාභ අයදුම්පත් සංඛ්‍යාව 1,101 ක්වූ | මියගිය සාමාජිකයින්ට හිමි ප්‍රතිලාභ අයදුම්පත් ඉදිරිපත් කළ ද, සාමාජිකයා හෝ අර්ථලාභීන් නිවැරදිව තහවුරු කර ගැනීම සඳහා ප්‍රමාණවත් තොරතුරු ගොනුවට ඉදිරිපත් කර නොමැති | මියගිය සාමාජිකයන් වෙනුවෙන් ලැබිය යුතු ප්‍රතිලාභ මුදල් කඩිනමින් නිදහස් කිරීම සඳහා සාර්ථක |

| | | | |
|---|---|---|---|
| | අතර ඉන් අයදුම්පත් 220 ක් අයදුම්පත් භාරදුන් දිනයේ සිට වසර 10 ත් 15 ත් අතර කාලයක සිටද අයදුම්පත් 27 ක් වසර 4 ත් 13 ත් අතර ද අයදුම්පත් 8 ක් අවුරුදු 6 ත් 10 ත් අතර කාලයක සිට ද පවතින අතර අයදුම්පත් 210 ක් ප්‍රතික්ෂේප වී තිබුණි. මෙම නොගෙවූ මරණ ප්‍රතිලාභ වටිනාකම කොපමණද යන්න මූල්‍ය ප්‍රකාශන තුලින් අනාවරණය කර නොතිබුණු අතර එහි ප්‍රගතිය පිළිබඳවද සෑහීමකට පත්විය නොහැකි විය. | අවස්ථාවලදී සහ සාමාජිකයා හෝ අර්ථලාභීන් නිවැරදිව තහවුරු නොවන අවස්ථාවලදී, කම්කරු කොමසාරිස් (සේවක අර්ථසාධක අරමුදල)ගේ අනුමැතිය මත අදාළ අර්ථලාභීන් දැනුවත් කිරීමෙන් අනතුරුව අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීම සිදු කරනු ලැබේ . එසේ ප්‍රතික්ෂේප කරනු ලබන අයදුම්පත්‍ර සම්බන්ධයෙන් අදාළ අර්ථලාභීන් විසින් නිවැරදි හා ප්‍රමාණවත් තොරතුරු පසුව ඉදිරිපත් කරන අවස්ථාවලදී, ප්‍රතික්ෂේප කරන ලද ගොනු පරිගණක පද්ධතියෙන් ඉවත් කර, අර්ථලාභීන් වෙත ප්‍රතිලාභ ගෙවීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි. | වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කල යුතුය. |
| (ඈ) | සේවක අර්ථසාධක අරමුදල් අංශයේ වැය ශීර්ෂය යටතේ මිලදී ගෙන තිබූ පරිගණක පුටු සහ ලිපිකරු පුටු 55 න් 53 ක්ද, Heavy Duty ඡායා පිටපත් යන්ත්‍රයක්ද, ලැප්ටොප් පරිගණක 30 න් 22ක්ද, ඡායා පිටපත් යන්ත්‍ර 20 න් 10 ක්ද සහ මුද්‍රණ යන්ත්‍ර 90 න් 06 ක් ද යන සම්පූර්ණ භාණ්ඩ තොගයම කම්කරු දෙපාර්තමේන්තු අවශ්‍යතා සඳහා භාවිතා කර තිබුණි. | සමස්ථ කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම අංශ වෙත සම්පත් බෙදී යාම විධිමත් කිරීම පරිපාලනයේ වගකීමක් වන බැවින් සමස්ථ කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යක්ෂමතාව ඉහල දැමීමේ අපේක්ෂාවෙන් එකී සම්පත් භාවිතා කර ඇති බව කාරුණිකව පෙන්වා දෙමි. | සේවක අර්ථසාධක අරමුදලේ මිලදී ගැනීම් එම අරමුදලේ කාර්යයන් සඳහාම භාවිතා කල යුතුය. |
| (ඇ) | බැංකු ගිණුම් 07 ක පැවති නොසැසඳුනු ශේෂ නිරවුල් කිරීම සඳහා 2020 ජනවාරි 09 වන දින පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම් කොන්දේසි අනුව ගිවිසුම්ගත දින සිට සති 08 ක් තුල අවසන් වාර්තාව ඉදිරිපත් කළ යුතුව පැවතියත්, අදාළ ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු මෙම වාර්තාවේ දින වන විටත් අත්කර ගැනීමට හැකි වී නොතිබුණි. | 2001 සිට 2018 වර්ෂය දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශනයන්හි පවතින ශේෂයන් නිරවුල් කිරීමට විශේෂ ව්‍යාපෘතියක් පෞද්ගලික විගණන ආයතනයක සහභාගිත්වය ඇතුව 2020 ජනවාරි මාසයේදී ආරම්භ කල ව්‍යාපෘතියේ අතුරු වාර්තාවක් 2020 ඔක්තෝබර් 30 වන දිනට ඉදිරිපත් කර ඇත. 2022 සහ 2023 වර්ෂයන් තුලදී ද අදාළ දත්ත ස්වාධීනව ලබා ගැනීමට ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරිතුමාගේ ප්‍රධානත්වයෙන් ලංකා බැංකුවේ නිලධාරීන් සමඟ සාකච්ඡා කිහිපයකින් පසු පොදු හඳුනාගැනීමේ කේතයක් සහිත දත්ත ගොනුවක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. | දිර්ඝ කාලයක සිට පැවත එන මෙම බැංකු ගිණුම් නිරවුල් නොවීමේ ගැටළුව තවදුරටත් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට කළමනාකරණය අවධානය යොමු කල යුතුය. |
| (ඉ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදලේ පනතේ 15 වගන්තිය ප්‍රකාරව පනත අදාල වන සේවකයෙකුගේ සේවායෝජකයා විසින් සේවකයාගේ සෑම මසකම දායක මුදල සේවකයාගේ ඉපයීම්වලින් අඩුකොට ඊළඟ | පිළිතුර ඉදිරිපත් කර නොමැත. | පනතේ නිර්දේශයන් ප්‍රකාරව දායක මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මාසයන්හි අන්තිම දිනයට පෙර අරමුදලට ගෙවිය යුතුය. එහෙත් 2021 හා 2022 වර්ෂයන්හිදී අලුතින් ලියාපදිංචි වූ ආයතන දායක මුදල් ගෙවීම් සම්බන්ධව කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී පිළිවෙලින් ආයතන 102 ක් හා 95 ක් ලියාපදිංචි දින සිටම දායක මුදල් ගෙවා නොතිබුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 10,503 ක් අයකර ගැනීම සඳහා අරමුදල විසින් බාහිර ආයතනවලට එරෙහිව පවරා ඇති මුළු නඩු සංඛ්‍යාව 13,760 ක්ද, බාහිර ආයතන විසින් අරමුදලට එරෙහිව මුළු වටිනාකම රු.මිලියන 201.35 ක් ඉල්ලුම්කර අධිකරණයේ පවරා ඇති මුළු නඩු සංඛ්‍යාව 62 ක් විය. මෙම නඩු 62 න් නඩු 32 ක්ම 2015 හා 2019 වර්ෂයන් හි එක් පුද්ගලික ආයතනයක් විසින් අරමුදලට එරෙහිව පවරන ලද නඩු විය. වර්ෂය අවසානයට අක්‍රිය හා විවෘත වරෙන්තු තත්ත්වයේ නඩු පිළිවෙලින් 3,309ක් හා 2015 ක් තිබූ අතර අය කර ගැනීමට ඇති මුදල රු.මිලියන 1,823.36 ක් හා රු.මිලියන 533.82 ක් විය. | අරමුදල විසින් බාහිර ආයතන වලට එරෙහිව අධිකරණවල පවරා ඇති නඩු තොරතුරු අදාල දිස්ත්‍රික් හා උප කාර්යාල මගින් කැඳවා ලබා දී ඇති අතර බාහිර ආයතන විසින් අරමුදලට එරෙහිව අධිකරණ වල පවරා ඇති නඩු වලට අදාල තොරතුරු නීති ක්‍රියා අංශය මගින් ලබා දී ඇත. එබැවින් එහි සංශෝධනයක් නොමැති බව කාරුණිකව දන්වා සිටිමි. | නීතිමය ක්‍රියාමාර්ග ඉක්මණින් අවසන් කර ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කර හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහ පාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදලට ස්වාධීන වූ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබූ අතර ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ අභ්‍යන්තර විගණන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරනු ලබයි. අරමුදලේ පරිපාලන කටයුතු සිදු කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 14 ක් වුවත්, තථ්‍ය සංඛ්‍යාව 8 දෙනෙකුට සීමා වී තිබුණි. අරමුදල විසින් රු.ට්‍රිලියන 3.4 ක පමණ සාමාජික අරමුදලක් කළමණාකරණය කරනු ලබන තත්ත්වයක් තුළ දෙපාර්තමේන්තු අභ්‍යන්තර විගණනය ශක්තිමත් කල යුතු බවට 2013 වර්ෂයේ සිට දිගින් දිගටම රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාව මඟින් නියෝග කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අරමුදලේ විගණන කටයුතු සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට පියවර ගෙන නොතිබුණි. අරමුදලේ 2022 වර්ෂය සඳහා සකස් කල අනුමත අභ්‍යන්තර විගණන සැලැස්ම හා වර්ෂයට අදාලව නිකුත් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා ද විගණකාධිපති වෙත ඉදිරිපත් නොවීය. | ස්වාධීන වූ විගණන හා කළමණාකරන කමිටුවක් පිහිටුවීම යෝග්‍ය වන අතර, මෙම අරමුදලේ පරිපාලන කටයුතු පමණක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සිදු කරන අතර මූල්‍ය පරිපාලනය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වේ. එම නිසා ස්වාධීන විගණන හා කළමණාකරන කමිටුවක් පිහිටුවීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියා ලෙස මා හට ඇති බලතල ප්‍රකාරව කල නොහැකි වේ. | අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |